පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 08 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- පෙරදිග සංගීතය

පාසලේ නම : ..................................................

ඇතුළත්වීම් අංකය : ..................

කාලය : පැය 02 යි

## I පත්‍රය

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **1 සිට 10 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) ශුද්ධ ස්වර හත ම යොදා ගන්නා රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතයකි.

(1) ඇහැළ මහට ඇහැළ ගහක (2) සිරස නමමු මව්පොළොවට
(3) හෝ හෝ ගා රැල්ල බිඳෙනවා (4) සිරි සාර අති ශාන්ත

(02) ස ස ග - | රි රි ම - | ග ග ප - | ම ධ ප - යන ස්වර ස්ථාපන ගීතයේ අවසන් ගී පාදය වන්නේ,

(1) ප ප නි - | ධ ධ ස් - | නි නි ධ ප | ධ නි ස් -
(2) ස රි ග ම | රි ග ම ප | ග ම ප ධ | නි - ස් -
(3) ස රි ග ම | ප ධ නි ස් | ස් නි ධ ප | ම ග රි ස
(4) ස් - ධ - | නි - ප - | ධ - ම - | ප ම ග -

(03) තාලයක දුර්වලම ස්ථානය වන්නේ,

(1) බලිය වේ. (2) අනුතාල වේ.
(3) සමග්‍රහය වේ. (4) විභාග වේ.

(04) සිතාරයේ සහ එස්රාජයේ ප්‍රධාන තත සුසර කරනු ලබන්නේ,

(1) මන්ද්‍ර ප ස්වරයටය. (2) මන්ද්‍ර ම ස්වරයටය.
(3) තීව්‍ර ම ස්වරයටය. (4) ග ස්වරයටය.

(05) ''හේමමාලි'' නූර්තිය රචනා කරන ලද්දේ,

(1) නීතිඥ චාල්ස් ඩයස් විසිනි (2) නීතිඥ ජෝන් ද සිල්වා විසිනි
(3) සී දොන් බස්තියන් මහතා විසිනි (4) පිලිප්පු සිඤ්ඤෝ මහතා විසිනි

(06) කුණ්ඩලකේෂී නාට්‍යයේ නිෂ්පාදකවරයා වන්නේ,

(1) ගුණසේන ගලප්පත්ති මහතා (2) පී.වැලිකල මහතා
(3) ලයනල් අල්ගම මහතා (4) මහගමසේකර මහතා

(07) සරල ගීතයක අන්තරා කොටස හඳුන්වන්නේ,

(1) Interlude නමිනි (2) Song නමිනි
(3) Verse නමිනි (4) Chorus නමිනි

(08) කාන්තාවන්ට සුවිශේෂී ස්ථානයක් හිමිවන කෙත හා බැඳි ගී විශේෂයකි.

(1) කමත් ගී (2) ගොයම් ගී
(3) පැල් ගී (4) නෙළුම් ගී

(09) ගී පාදයක ලඝු ගුරු අක්ෂරවලට හිමි මාත්‍රා ගණන හඳුන්වනුයේ,

(1) සඳැස් මාත්‍රා නමිනි (2) ගී මාත්‍රා නමිනි.

(3) ප්ලුත මාත්‍රා නමිනි (4) ලුහු මාත්‍රා නමිනි

(10) ''උදුල තරුවැල වතල සොඳුරු'' මෙම ගී පාදය අයත් වන්නේ,

(1) සුළු මැදුම් දෙතිතට ය. (2) සුළු තනි තිතට ය.

(3) මැදුම් මහ දෙතිතට ය. (4) සුළු මහ දෙතිතට ය.

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

(සිරිලංකා රජින්දා, නෙළුම් ගී, කර්ණාටක, නව නාට්‍ය, රවීන්ද්‍ර ගී, ගොයම් ගී)

(11) නාඩගම් ගී සඳහා …………………………………….. සංගීතයේ ආභාසය ලැබී ඇත.

(12) ''තෙල් ගාලා හිස පීරන් නෑනෝ'' යන සරල ගීතය ……………………………………..ඇසුරින් නිර්මාණය කොට ඇත.

(13) …………………………………….. ගීතය ශ්‍රී වික්‍රම නූර්තියට අයත් වේ.

(14) ……………………………………..බෙංගාල ප්‍රදේශයේ වඩාත් ප්‍රචලිතය.

(15) ''සත් සියක් කපු මල්'' යන ගීතය …………………………………….. ගීතයකි.

- **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න සඳහා හරි නම් ( ✓ )ලකුණ ද වැරදි නම් (✗ ) ලකුණ ද යොදන්න.**

(16) පැදියක සෑම විටම සඳැස් මත් ගණනට වඩා ගී මත් ගණන වැඩිවේ. (  )

(17) බටහිර සංගීත ප්‍රස්තාරකරණයේදී යොදා ගනු ලබන මහා රේඛා මණ්ඩලය Great Staff ලෙස හඳුන්වයි. (  )

(18) ත්‍රී තාලයේ මාත්‍රා ගණන 16 කි. (  )

(19) කිතුනු බැති ගී සඳහා හින්දුස්ථානී සංගීතයේ ආභාසය ලැබී ඇත. (  )

(20) ''පායාලා අඹරේ'' යන ගීතය බැලසන්ත නාඩගමට අයත් වේ. (  )

## II පත්‍රය

- **තෝරාගත් ප්‍රශ්ණ 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

(01) (A) සං සං ධ |ප ග ග |රි ග රි | ස ස රි

(B) ස රි |ග - ම |ප ප |ප - සං

(i) ඉහත ස්වර පාද අයත් රාග හඳුනාගෙන නම් කරන්න.
(ල.2)

(ii) A, B රාග අතුරින් ඔබ කැමති රාගයක ස්වර ස්ථාපන ගීතයේ ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න.
(ල.6)

(iii) B රාගයේ ආරෝහණ අවරෝහණ ස්වර ලියන්න. (ල.4)

(02) (A) × × - | × × × × | × × - |× × × ×

(B) × × × × |× × × × |× × × × |× × × ×

(i) ඉහත A,B රිද්ම රටාවලට ගැළපෙන හින්දුස්ථානි තාල **දෙක** පිළිවෙලින් ලියන්න. (ල.2)

(ii) (A) අක්ෂරයෙන් නිරූපණය වන තාලය, නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.
(ල.4)

(iii) එම තාලයට සමාන දේශීය තිත නම් කරන්න. (ල.2)

(iv) බලිය, සමග්‍රහය, යන පාරිභාෂික පද කෙටියෙන් හඳුන්වන්න.

(03) |ප ප ම ම |ග ග රි රි | ස රි ග ම |ප - - -

(i) ඉහත ස්වර ප්‍රස්තාරය බටහිර ක්‍රමයට ප්‍රස්තාර කරන්න. (ල.4)

(ii) පහත නම් වලට අදාළ සංකේත ඇඳ ඒවාහි වටිනාකම් ලියන්න.
(අ) මිනිම්
(ආ) සෙමිබ්‍රීව්
(ඇ) ඩොටඩ් මිනිම්
(ඈ) ක්වේවර් (ල.8)

(04) හින්දුස්ථානි සංගීතයට අයත් ගායන ශෛලීන් දෙකක් පිළිබඳව කරුණු පහත සඳහන් වේ.

(A) රවීන්ද්‍රනාත් තාගෝර් තුමා විසින් නිර්මිතය.

(B) මීරා බායි, තුල්සිදාස් ගැන කියවේ.

(i) ඉහත තොරතුරුවලට අදාළ ගායන ශෛලීන් **දෙක** නම් කරන්න. (ල.2)

(ii) එම ගායන ශෛලීන් දෙක පිළිබඳව ඔබ දන්නා වෙනත් කරුණු **හතර** බැගින් ලියන්න.
(ල.8)

(iii) ඉන් එක් ශෛලියකට අයත් ගීතයක ස්ථායී කොටස ලියන්න.
(ල.2)

(05) (i) සඳැස් මාත්‍රා හා ගී මාත්‍රා කෙටියෙන් විස්තර කරන්න. (ල.4)

(ii) ''බුද්ධං සරණේ සිරස දරාගෙන'' මෙම කවි පාදයේ සඳැස් මත් ගී මත් ගණනය කර වෙන වෙන ම ලියා දක්වන්න.
(ල.2)

(iii) ගොයම් ගී, නෙළුම් ගී, කමත් ගී අතුරින් **දෙකක්** පිළිබඳ කරුණු **දෙක** බැගින් ලියන්න. (ල.4)

(iv) ඉන් එක් ගී වර්ගයකට අයත් කවියක් ලියන්න. (ල.2)

(06) (i) සිතාරයේ සහ එස්රාජයේ සමානතා හා අසමානතා **දෙක** බැගින් ලියන්න. (ල.4)

(ii) ඉන් එක් භාණ්ඩයක රූප සටහනක් ඇඳ කොටස් **හතරක්** නම් කරන්න. (ල.6)

(iii) ඉහත භාණ්ඩ දෙකෙහි නිර්මාණකරුවන් පිළිවෙලින් නම් කරන්න. (ල.2)

(07) (i) පහත වරහන් තුළ ඇති ගී වර්ග නියමිත පරිදි වගුගත කරන්න.

(දී කිරි දීකිරි, සිරි සඟබෝධි මාළිගාවේ, පායාලා අඹරේ, මුදු පතුළ යට ඉඳලා, අම්බරයේ සඳ, ලෝනා මුනි රාජගේ, ගම්භිර කාලිංග නුවර)

| නූර්ති | නාඩගම් | නව නාට්‍ය |
|---|---|---|
| 1. | | |
| 2. | 1. | 1. |
| | 2. | 2. |

(ල.6)

(ii) සරල ගීතයක ඇතුළත් පහත කොටස් ව්‍යවහාරික සංගීතයට අනුව නම් කරන්න.

(a) තනුව

(b) කුඩා ස්වර ඛණ්ඩ

(c) පෙර වාදනය

(d) ස්ථායි කොටස (ල.4)

(iii) ඔබ දන්නා දමිළ ගීතයක ස්ථායි කොටස ලියන්න. (ල.2)